

බුදුරජාණන් වහන්සේ තම මව වන මාතෘ දිව්‍යරාජයාණන් වහන්සේට තුසිත දෙව් ලොවේ දී ධර්මය දේශනා කොට මනුලොවට වැඩි ස්ථානය ( සංකස්ස පුර) ඉදි කර ඇති අශෝක කුළුණ

## ஃ සර්ව බලධාරී දේව බලයක් බුදු සමය පිළිගන්නේ නෑ

– බෙලිගල්ලේ ධම්මජෝති හිමි

දේවවාදී – නිර්මාණවාදී ආගම්වලින් බුදු සමය වෙනස් වන අයුරු. සියලු බල සහිත දෙවිවරයකුගේ පැවැත්ම – බෞද්ධ හේතු ඵල දර්ශනය අනුව ප්‍රතික්ෂේප වන අයුරු. ලෝකයේ පවත්නා හේතු ඵල යථාර්ථය අනුව මිනිස් චර්යාවට හිමි වන වැදගත්කම සහ එහි ප්‍රායෝගිකත්වය. ලේඛක හිමි නම – රුහුණු විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ කථිකාචාර්ය වරයෙකි.

## ஃ මරණින් මතු උත්පත්තිය: අන්තරාභවය පිළිබඳ විමැසීමක්.

– ජී.ඒ. ගාමිණී රත්න ශ්‍රී

සත්වයා මරණින් මතු උපත ලබන අයුරු පිළිබඳ බුදුරදුන්ගේ දේශනා සහ පසුකාලීන බෞද්ධ ආචාර්යවරුන්ගේ අදහස් විමසා බැලීමකි. ‘අන්තරාභවය’ නමින් නූතන බොදුනුවන් අතර ප්‍රකටව ඇති අදහසෙහි නිරවද්‍යතාව පිරික්සා බැලීම – මෙම ලේඛකයාගේ ප්‍රධාන අරමුණ වී ඇති බව පෙනේ. ලේඛකයා රුහුණු විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යායනාංශයේ කථිකාචාර්යවරයෙකි.

## ஃ තෙරුවන පිළිබඳ ශුද්ධ සංඥාව

– ඒ. එම්. ප්‍රේමරත්න

පුද්ගලයා තුළ ත්‍රිවිධ රත්නය පිළිබඳ ශ්‍රද්ධාව ගොඩනංවන සාධක. දහම් මඟට බැස ගැනීමට හේතු වන තරමේ උනන්දුවක් ශ්‍රාවකයා තුළ අනුක්‍රමයෙන් ඇති කරවන හේතු. රසවත් ලේඛන ශෛලියක් සතු සුප්‍රකට ලේඛකයෙකි, මෙම ලිපිය සපයා ඇත්තේ

## ஃ සිරිලක සඟරුවන

කලකට පෙර අපවත් වී වදාළ සුප්‍රකට – වියත් හිමිවරු දෙනමකට උපහාර වශයෙන් – උන්වහන්සේගේ ගුණ සමරා පළකැරෙන විශේෂ ලිපි දෙකකි.

## ஃ බුදුරුවට කරන නිගරුව

– දරණාගම කුසලධම්ම හිමි

බුදුරදුන්ට නිගා වන ලෙස – බුදු රුව විවිධ කටයුතු වලට නුසුදුසු ලෙස භාවිතා කිරීමට එරෙහිව, ක්‍රියාත්මක කළ යුතු නව යෝජනා සහ ඒ පිළිබඳ පැවැත්වුණු සාකච්ඡා ආදිය පිළිබඳ විස්තර ඇතුළත් කාලීන ලිපියකි. කොළඹ සුප්‍රකට විහාරස්ථානයක අධිපති ධූරය දරන ලේඛක හිමි නම, ශාස්ත්‍රපති උපාධි ලාභියෙකි.

## ஃ ශ්‍රී ලංකාවේ දිනක් තුළ සිදු වන අපරාධ ස්ත්‍රී දූෂණ 06 යි; මිනීමැරුම් 06 යි. අහෝ෴ ධර්ම ද්වීපයකට ගිය කල.

– කතුවැකිය.

## ஃ දෙලොවටම වැඩ සලසන ලෝ වැඩ සඟරාව

– සිරිපාල මාදුවගේ

‘කෝට්ටේ යුගය’ නමින් ප්‍රකට ඓතිහාසික යුගය තුළ දී ‘වීදගම මෛත්‍රිය’ නමින් එවකට වැඩ සිටි සුප්‍රකට සාහිත්‍යධර – ධර්මධර හිමි නමක විසින් රචනා කැරුණු බව සැලකෙන සුප්‍රකට බෞද්ධ කාව්‍ය ග්‍රන්ථයකට අර්ථ විවරණයක් හා විමර්ශනයකි. ලේඛකයා ආචාර්ය උපාධි ලාභියෙකි.

## ஃ ‘සාර’ – ‘අසාර’ ධර්ම විග්‍රහ කොට දැක්වෙන සිඟාලෝවාද සූත්‍රය

– නිර්මලා අමරසිංහ

ගිහි ජීවිතය විධිමත් කිරීම සඳහා ‘සිගාල’ නම් වූ පුද්ගලයකුට – ඔහු එතෙක් පිළිපදිමින් සිටි මිථ්‍යා වන්දනා පිළිවෙතකට නව අර්ථකථනයක් දෙමින් බුදුරදුන් විසින් දේශනා කොට වදාළ ධර්මෝපදේශ ඇතුළත් සූත්‍රයකට අර්ථ විවරණයකි මෙම ලිපිය. ලේඛිකාව ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි ලාභිනියකි.

## ⁂ මළගමෙන් බිහි වුණු ශෝක ප්‍රකාශයේ මළගම

– දයා අංහෙට්ටිගම.
බෞද්ධ සංස්කෘතියේ ආභාසයෙන් පෝෂණය වී තිබූ පැරැණි ශ්‍රී ලංකාවේ අවමඟුල් ශෝක ප්‍රකාශවල සාහිත්‍යමය අගය පිළිබඳ විමර්ශනයක් ලෙස මෙම ලිපිය හැඳින්විය හැකි ය.

## ⁂ සදහම් දැනුම

– වහුමුවේ විජයවංස නා හිමි
බුදු දහම හා ඊට අදාළ අනෙකුත් විවිධ විෂය කරුණු පිළිබඳ පාඨක ජනතාවට දැනුම ලබා දෙන විශේෂාංගයකි. කෙටි ප්‍රශ්න හා පිළිතුරු සහිත මෙම විශේෂාංගය – දහම හදාරන සිසුනට විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකි ය. අනුරපුර සුප්‍රකට පිරිවෙනක අධිපති ධුරය හොබවන මෙම ලේඛක හිමිනම ශාස්ත්‍රපති උපාධි ලාභියෙකි.

## ⁂ ‘අයං වස්සාන කාලො’ මේ වස්සාන කාලයයි.

–උතුරාවල ධම්මරතන හිමි
භාරතයේ පැවැති පැරැණි සිරිතකට නව අර්ථකථනයක් දෙමින් බුදුරදුන් අනුදැන වදාළ වස් විසීමේ ශාසනික චාරිත්‍රය පිළිබඳ ඓතිහාසික තොරතුරු දැක්වීම හා ඒ පිළිබඳ විමර්ශනයක යෙදීමයි, මෙම ලේඛකයාගේ අරමුණ වී ඇත්තේ. මෙම ලිපිය සකස් කළ ලේඛක හිමි නම – මහාචාර්යවරයෙකි.

## ⁂ විශේෂ බෞද්ධ ප්‍රවෘත්ති කිහිපයකි

## ⁂ බුදු දහම හා වෙළෙඳ පොළ ආර්ථිකය

–චන්දිම විජේබණ්ඩාර
බුදු දහමෙන් ඉදිරිපත් වන ජීවන දැක්මට අනුව තණ්හාව නිරුද්ධ කරන පිළිවෙතකට එළඹෙන ප්‍රබුද්ධ සමාජයක් තුළ වෙළෙඳ පොළ ආර්ථිකයක පැවැත්මක් අපේක්ෂා කිරීම යුක්ති සහගත ද? යන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුරක් සොයා ගැනීමයි – මෙම ලේඛකයාගේ බලාපොරොත්තුව වී ඇත්තේ. ලේඛකයා – ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකි.

## ⁂ දීඝවාපියේ නව ධර්ම ශාලාව

– බන්දුල අලහකෝන්
අම්පාර දිස්ත්‍රික්කයට අයත් ඓතිහාසික විහාරස්ථානයක් ඇසුරුකොට ඉදිවූ නව ධර්ම ශාලාවක් විවෘත කිරීම පිළිබඳ පළ වන විශේෂ ප්‍රවෘත්ති විශේෂාංගයකි.

## ⁂ බෞද්ධයාගේ පාංශුකූලය කෙසේ සකස් විය යුතු ද?

– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි
අවමඟුලකදී – මිය ගිය තැනැත්තා වෙනුවෙන් මහා සංඝයා වහන්සේ වෙත පාංශුකූලය පිරිනමක සිරිතේ දී වර්තමාන සමාජයේ බොහෝ තැන්වල සිදු කැරෙන – පුහු ආටෝපයෙන් පිරුණු සිරිත් විරිත් සැකෙවින් පෙන්වා දී ඊට ධර්මානුකූල කෙටි පිළිතුරක් ලබාදීමට උත්සාහ දරා ඇති කෙටි ලිපියකි, මෙය. ‘ධම්ම චින්තා’ විශේෂාංගය යටතේ මෙම ලිපිය පළ වන අතර, එය ලියා ඇත්තේ ශ්‍රී ලංකාවේ සුප්‍රකට “ධර්මදේශක හා ලේඛක හිමි නමක්” විසිනි.

## ⁂ උගත්කමෙන් නැසෙන මිනිස්සු

– දිවියාගහ යසස්සි නා හිමි
‘සාර්ථක ජීවිතයකට ධම්ම පදයෙන්’ විශේෂාංගය යටතේ පළ වන කුඩා ලිපියකි. දහම තුළින් ලබාගන්නා ජීවිත දැක්ම අනුවම ‘ප්‍රඥව’ ගොඩනැගෙන බව ද ප්‍රඥව නොමැති උගතකු වුවද තමන් ලත් දැනුමෙන් අනතුරට පත්වීමේ අවදානමක් ඇති බවද මෙම ලිපියෙන් පෙන්වාදීමට උත්සාහ දරා ඇත. ත්‍රිපිටකාචාර්ය උපාධිය සහ ගෞරව නාම රැසක් හිමි ලේඛක හිමිනම ශ්‍රී ලංකාවේ සුප්‍රකට වියත් හිමි නමකි.

## ⁂ නාරම්මල – මැටියගනේ මයුරාවතී රජ මහා විහාරය

– දර්ශි කලුබෝවිල
දේවානම් පියතිස්ස රජුගේ දියණියක වූ ‘මයුරාවතී කුමරිය’ වෙනුවෙන් ඉදි වී ඇතැ’යි සැලකෙන – කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ඉපැරැණි – ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරුයි මෙම ලිපියෙන් දැක්වෙන්නේ.